**ජා.මු.අරමුදලේ කළමනාකාර අධ්‍යක්ෂිකා ක්‍රිස්ටීන් ලගාඩ් මහත්මිය සහ ශ්‍රී ලංකාවේ මුදල් ඇමති මංගල සමරවීර හා ශ්‍රී ලංකා මහ බැංකු අධිපති ඉන්ද්‍රජිත් කුමාරස්වාමි යන මහත්වරුන් අතර හමුව**

2019 ජනවාරි 15

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කළමනාකාර අධ්‍යක්ෂිකා ක්‍රිස්ටීන් ලගාඩ් මහත්මිය, ශ්‍රී ලංකාවේ මුදල් අමාත්‍ය මංගල සමරවීර හා ශ්‍රී ලංකා මහ බැංකු අධිපති ඉන්ද්‍රජිත් කුමාරස්වාමි යන මහත්වරුන් අද දිනයේදී හමු වූවාය.

එම හමුවෙන් අනතුරුව ලගාඩ් මහත්මිය පහත  ප්‍රකාශය නිකුත් කළාය:

“අමාත්‍ය සමරවීර මහතා සහ ශ්‍රී ලංකා මහ බැංකු අධිපති කුමාරස්වාමි මහතා හමුවීමට ලැබීම ගැන මම සතුටට පත්වූයෙමි. රටෙහි පවතින අභියෝගාත්මක ආර්ථික පරිසරය සහ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් පිළිබඳව අපි සාකච්ඡා කළෙමු. ජා.මු.අරමුදලේ සහය සහිත වැඩ සටහන යටතේ ඔවුන්ගේ ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවේ අඛණ්ඩ කැපවීම පිළිබඳව එහිදී අවධාරණය කෙරුණි”.

“එම න්‍යාය පත්‍රය ඵලදායී අයුරින් ක්‍රියාත්මක කර ශක්තිමත් ප්‍රතිපත්ති මාලාවක් හඳුන්වා දීම තුළින් ශ්‍රී ලංකාවේ ජනතාවට ප්‍රතිලාභ ලැබෙන තිරසාර, ඉහළ ගුණාත්මක වර්ධන මාවතකට ශ්‍රී ලංකාව යොමු කලහැකි බවටත්, එය විශ්වසනීයත්වය ශක්තිමත් කිරීම සඳහා ප්‍රධාන සාධකයක් වන බවටත් එකඟ විය”.

“මෙම ප්‍රයත්නයන්ට ශ්‍රී ලංකාවේ බලධාරීන්ට සහය ලබාදීමට ජා.මූ.අරමුදල සූදානම්ව සිටින අතර, විස්තීරණ ණය පහසුකම පිළිබඳ සාකච්ඡා නැවත ආරම්භ කිරීමට ජා.මූ.අරමුදලේ දූත කණ්ඩායමක් පෙබරවාරි මස මැද භාගයේදී කොළඹ සංචාරය කිරීමට නියමිතය”.

ජා.මූ. අරමුදලේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද

ජා.මූ.අරමුදලේ පුවත්පත් නිවේදන අංක 19/04
https://www.imf.org/en/News/Articles/2019/01/15/pr1904-stmnt-christine-lagarde-meet-sri-lanka-fin-min-mangala-samaraweera-gov-indrajit-coomaraswamy